බලංගොඩ නගර සභාව

**රත්නපුර දිස්ත්‍රික්කය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉදිරියට ලද කඩකුලී ආදායම් රු. 46,358 ක් ලැබිය යුතු කඩකුලී ආදායමට හිලව් කර තිබුණි. | වත්කම් හා වගකීම් ශේෂ එකිනෙකට හිලව් නොකල යුතු වේ. | ඉදිරියට ලද කඩකුලී ආදායම් සහ ලැබිය යුතු කඩකුලි ආදායම් නැවත ජ'නල් සටහන් අංක 07, 08, 09 මගින් 2019 වර්ෂයේ ගලපා ඇත. |
| (ආ) නගර සභාවට එරෙහිව අධිකරණයේ විභාග වන නඩු 4 ක් සහ සභාව විසින් අධිකරණයේ පවරන ලද නඩු 3 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු වේ. | මෙම නඩු මේ වනවිටත් අධිකරණයේ විභාගවෙමින් පවතින අතර යම් හෙයකින් එම නඩු කටයුතු මගින් අනාගතයේදී මූල්‍ය ප්‍රකාශවලට බලපෑමක් එල්ලවන්නේ යැයි අපේක්ෂා කරන්නේ නම් පමණක් ඒවා මූල්‍ය ප්‍රකාශවලට ගැලපීම හෝ හෙළිදරව් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) පූර්ව කාලපරිච්ඡේද වැරදි රු. 175,709 ක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | වැරදි නිවැරදි කර ගිණුම් ගැලපීමට කටයුතු කල යුතු වේ. | 2017 වර්ෂවල පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු පුස්තකාල පොත් 2019 වර්ෂයේ නිවැරදි කර ගිණුම් ගත කරන ලදී. එමෙන්ම 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයට අනුව ඉවත් කරන ලද පුස්තකාල පොත් 2019 වර්ෂයේ දී ගිණුම් වලට ගලපන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වටිනාකම රු. 57,770 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 18 ක් අවසන් තොග වටිනාකමට ඇතුලත් කර තිබුණි. | තොග අයිතම නිවැරදිව හඳුනාගත යුතු වේ. | සුදු කොඩි 375 හා සෙටින් පාට කොඩි 355 හැර ඉතිරි භාණ්ඩවල වටිනාකම 2019 වර්ෂයේ දී ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරන ලදී. සුදු කොඩි හා සෙටින් පාට කොඩි වෙනම ලේඛනයක සටහන් කිරීමට කටයුතු කරන ලදී. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දී මිළදී ගෙන තිබුණු එකතුව රු. 540,386 ක් වූ යන්ත්‍ර හා උපකරණ සහ ලීබඩු හා සවිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කල යුතු වේ. | 2018 වර්ෂයේ මිලදී ගත් යන්ත්‍ර හා උපකරණ ජංගම නොවන වත්කම් ලෙස 2019 වර්ෂයේදී ගිණුම් වලට ඇතුලත් කරන ලදී. |
| (ඊ) | සමාලෝචිත හා ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණවලින් ඉවත් කරන ලද පිරිවැය රු. 39,947 ක් වූ පුස්තකාල පොත් සහ විකුණුම් වටිනාකම රු. 57,835 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවිකිරීම්වල පිරිවැය හඳුනාගෙන අදාල වත්කම් ගිණුම්වලට ගැලපීම් සිදු කර නොතිබුණි. | ඉවත් කරන ලද වත්කම් වල පිරිවැය ගිණුම් වලට ගැලපිය යුතු වේ. | 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද රු. 59,195 ක පුස්තකාල පොත් ද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා ලීබඩු වටිනාකම නිවැරදි කිරීමට කටයුතු කර ඇති අතර 2018 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනා ගන්නා ලද ඉවත් කිරීමට නිර්දේශ කරන ලද පුස්තකාල පොත්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා ලීබඩු වටිනාකම රු. 20,886 ක් 2019 වර්ෂයේ දෙවන කාර්තුවේදී ගැලපීමට නියමිතය. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට නගර සභාව සතු ඉඩම් 20 කට අදාලව වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් සියලුම වත්කම් සබරගමුව පලාත් සභාව මඟින් හඳුන්වා දී ඇති වත්කම් කලමනාකරණ වැඩ සටහනට ඇතුලත් කර ඇති අතර ඉඩම් හා ගොඩනැගිලි සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වටිනාකම ලබා ගෙන එම වැඩ සටහනට ඇතුලත් කිරීමට නියමිතය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී අවසන් ගබඩා තොගය රු. 3,487,377 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වේ. | මෙම අවසන් තොගය දිගින් දිගට පැවත එන වෙනසක් වන අතර 2019 වර්ෂයේ එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 776,932 ක් වූ ගෙවිය යුතු ශේෂ 16 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2018 වර්ෂයේ ගෙවිය යුතු ණයහිමි රු. 446,843 ක් සහ ගබඩා ණයහිමි රු. 330,089 ක් නිවැරදි කිරීම සඳහා 2019 වර්ෂයේ ගිණුම් වලට ගැලපීමට කටයුතු කරන ලදී. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 78,741 ක් වටිනා පුස්තකාල පොත් 270 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2018 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් මහජන පුස්තකාලයට ලැබුණු පොත් 2019 වර්ෂයේ ගිණුම් වලට ගැලපීමට කටයුතු කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | නගර සභාවට අයත් ආයුර්වේද මධ්‍යස්ථානයේ ආරම්භක හා අවසාන තොග පිළිවෙලින් රු. 458,927 ක් හා රු. 369,262 ක් සහ සම්පත් පියසේ රු. 5,039 ක් වූ අවසන් තොගය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | අතපසුවීමකින් ආයුර්වේදයේ හා සම්පත් මධ්‍යස්ථානයේ තොග ගිණුම්වලට ඇතුලත් කිරීම මගහැරී ඇති අතර 2019 වර්ෂයේදී අවසන් ගිණුම් පිලියෙල කිරීමේදී සියලු තොග ගිණුම් ගත කිරිමට නියමිතයි. |
| (ඕ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉදිරියට ලැබුණු වරිපනම් රු. 471,802 ක් වරිපනම් හා බදු පාලන ගිණුමට ගැලපුම් නොකර මිශ්‍ර තැන්පත් ගිණුමට බැරකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | වරිපනම් බදු සම්බන්ධයෙන් ඇති පරිගණක වැඩසටහනේ ඇති දෝෂයක් නිසා ඉදිරි වර්ෂවලට ලද වරිපනම් ඇතුලත් කිරීමේ හැකියාවක් නොපවතී. මෙය 2019 ජනවාරි මස වරිපනම් ආදායමට ගලපා ඇති අතර පරිගනක වැඩ සටහන නිවරදි කර එවැනි දෝෂ වලක්වා ගැනිමට කටයුතු කරනු ලැබේ. |
| (ක) | සමාලෝචිත වර්ෂය අවසානයට පාලන ගිණුම් 3 ක ශේෂ ඒවාට අදාල කේවල ගිණුම් ශේෂ එකතුව අතර රු. 558,589 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | නීත්‍යානුකූලව කඩය පවරා නොමැති බදුකරුවෙකුගෙන් ලැබිය යුතු මුදල් ද, පෙර වර්ෂවල සිට පැවත එන සභාව සතු දේපල ගිණුම ද, බැංකෝ යන්ත්‍ර බිල්කිරීම අඩුවෙන් සටහන් කිරීම නිසා ඇතිවී තිබෙන වෙනස ද ජර්නල් සටහන් මඟින් 2019 වර්ෂයේ ගිණුම්වලට ගලපා ඇත. |

## 1.4 අනුකූල නොවීම
--------------------

නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | වටිනාකම | නිර්දේශය | ගනන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | | රු. | | |
| (අ) | නගර සභා ආඥා පනතේ 164 (2) වගන්තිය | 1987 වර්ෂයේ දී ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි නවාතැන් පළකින් ලැබීම් මත අයකල යුතු සියයට 1 ක බද්ද 2018 දෙසැම්බර් දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | - | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ සිට සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති නවාතැන්පල සදහා ඊට අදාල වාර්තා ලබා ගෙන ලැබීම් මත පදනම් වු 1% සංචාරක බද්ද ඉදිරියේදී අය කිරීමට කටයුතු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | කරමින් පවතින බව වාර්තා කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.2 වගන්තිය | නගර සභාවේ සභාපතිවරයා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම්කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් ප්‍රජාපාදක සංවිධානවල කොන්ත්‍රාත්කරුවන් තෝරාගත යුතු වුවත්, කොන්ත්‍රාත් 26 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | 11,993,714 | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු වේ. | සභා තීරණය යටතේ අනුමත සමිති හරහා ඉටු කිරීමටත් ප්‍රදේශීය ලේකම් වෙතින් හැකියා සහතිකය ලබා ගැනීමෙන් පසු එම ප්‍රජා පාදක සමිතිවලට අදාල කොන්ත්‍රාත් ලබා දී ඇත. රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012 යටතේ ඉදිරියේදී ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර කොන්ත්‍රාත් ඉටු කරන බව සඳහන් කරමි. |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය | ප්‍රජාපාදක සංවිධානයක් ලෙස හඳුනාගත නොහැකි බලංගොඩ ග්‍රාම නිලධාරී සුභසාධක සංගමය වෙත කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. | 1,968,143 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය ලේකම්වරයාට සෑහීමකට පත්විය හැකි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් හඳුනා ගන්නා ප්‍රජා සංවිධාන සඳහා ද කොන්ත්‍රාත් පිරිනැමිය හැකි බැවින් මහසභා තීරණය යටතේ මේ සඳහා අනුමැතිය ලබා දී ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,743,028 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,227,735 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

------------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළුහිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,590,000 | 8,991,122 | 7,993,892 | 4,012,406 | 8,276,000 | 8,372,029 | 8,887,800 | 3,015,177 |
| (ii) | කුලී | 24,360,000 | 28,088,669 | 28,144,527 | 804,356 | 28,633,000 | 23,387,731 | 23,031,819 | 942,067 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,000,000 | 3,804,125 | 3,804,125 | - | 4,042,000 | 3,165,883 | 3,165,883 | - |
| (iv) | වෙනත් ආදායම් | 28,310,000 | 24,356,748 | 23,745,450 | 160,164 | 25,175,000 | 17,644,659 | 17,509,073 | 1,549,963 |

### 2.2.2 වරිපනම් හා බදු

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂවල හිඟ වරිපනම් රු. 3,306,474 ක් අයකර ගැනීමට 2019 මාර්තු වනවිටද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රැස් කළ වරිපනම් හා බදු ආදායම රු. 893,908 කින් අඩු වී තිබුණි. | අප්‍රමාදව ආදායම් රැස් කිරීමට ක්‍රියා කළ යුතු වේ. | නගර සභාවට ආදායම් පරීක්ෂක තනතුරු 3ක් අනුමත වී තිබුණ ද 2017 වර්ෂයේ සේවය කරන ලද එකම ආදායම් පරීක්ෂක 2018 වර්ෂයේදී සේවයෙන් විශ්‍රාමගැනීම හේතුවෙන් වරිපනම් එකතු කිරීම කණිෂ්ඨ සේවක මහතුන් ලවා සිදු කර ගැනීමට සිදු විය. එසේම 2017 වර්ෂයේදී වරිපනම් එකතු කිරීමේ විශේෂ වැඩ සටහන්ද පවත්වන ලදී. එම හේතුන් නිසා 2017 ට සාපේක්ෂව 2018 වර්ෂයේදී රැස්කල වරිපනම් ආදායම අඩු වි ඇත. |

### 2.2.3 කුලී

------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂවල හිඟ කුලී රු. 433,604 ක් අයකර ගැනීමට 2019 මාර්තු වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් රැස් කිරීමට අප්‍රමාදව ක්‍රියා කළ යුතු වේ. | මෙම හිග කුලී විවිධ හේතුන් නිසා අයකර ගැනීමට නොහැකි වී ඇති අතර අය කිරීමට නොහැකි හිග ශේෂ කපා හැරීම සඳහා ඇමතිතුමා වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. එසේම අනෙකුත් කඩ කුලී අයකර ගැනීම සඳහා 2019 වර්ෂය තුල විශේෂ වැඩ සටහන් පැවැත්වීමට නියමිතය. |

**2.2.4** මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගැනීමට 2019 අප්‍රේල් වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආදායම් රැස් කිරීමට ක්‍රියා කළ යුතු වේ. | 2017 වර්ෂයට අදාල මුද්දර ගාස්තු උපලේඛන සකස් කර පලාත් සභාව වෙත යවා ඇති අතර එම ලේඛන වලට අදාල දෙපාර්තමේන්තු ගාස්තු ද ඉඩම් රේජිස්ට්‍රාර් කාර්යාලයට යවා ඇත. ඒ අනුව 2017 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ලැබීමට නියමිතය. 2018 ජනවාරි සිට 2018 දෙසැම්බර් මස දක්වා වූ මුද්දර ගාස්තුවලට අදාල උපලේඛණ ලබාදෙන මෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් දැනුම්වත් කර ඇත. |

2.2.5 එක්වන මුදල් හා දේපළ බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බදු පදනමට ලබා දෙන ලද කඩකාමර 03 කින් 2010 සහ 2013 වර්ෂයන්ට අදාලව ලැබිය යුතු එක්වන් මුදල් එකතුව රු. 314,748 ක් 2019 අප්‍රේල් වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාවේ ආදායම් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිග එක්වන් මුදල රු. 314,748 අයකර ගැනිමට කටයුතු කරන ලෙස අදාල විෂයභාර නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ආ) | වර්ෂ 03 සිට වර්ෂ 09 දක්වා කාලයක සිට ලැබිය යුතු දේපල බදු මුදල් එකතුව රු. 47,610 ක් 2019 අප්‍රේල් වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාවේ ආදායම් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂ කිහිපයක් මුලුල්ලේ පවතින හිඟ දේපල බදු මුදල් අයකර ගැනීමටත් එසේ නොවන්නේ නම් ඔවුන්ට විරුද්ධව නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරනු ලැබේ. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, මහජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) අතුරු ව්‍යවස්ථා** | | |
| නගර සභා අඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 101 කින් කාරණා 70 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට 2019 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවට විශේෂිත වූ කාර්යයන් සඳහා අප විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර ඇති අතර අනෙකුත් කාර්යයන් සඳහා සම්මත අතුරු ව්‍යවස්ථාව අප විසින් ගැනීමට කටයුතු කර ඇත. ඊට අමතරව ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳව පළාත් සභාව විසින් ලබා දුන් අතුරු ව්‍යවස්ථාව ගෙන ඇත. |
| **(ආ) ඝන අපද්‍රව්‍ය කළමණාකරණය** | | |
| අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් පසු ඉතිරිවන අවශේෂ කොටස් වර්ෂයකට මෙ.ටො. 504 ක් පමණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයට එක්රැස්වන නමුත් එම අපද්‍රව්‍ය පරිසරයට අහිතකර නොවන පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් 2019 මාර්තු වනවිටත් සකස් කර නොතිබුණි. | විධිමත් කසළ කළමනාකරණය පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ගොඩගසා ඇති නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා දාහක උදුනක් ඉදිකිරීම වැනි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත අතර මේ වන විට ගොඩගැසී ඇති නොදිරන අපද්‍රව්‍ය වෙන් කර රත්නපුර මහා නගර සභාවට යැවීමට කටයුතු කරමින් පවතී. |
| **(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක** | | |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව නගර සභාව දැනුවත්වී තිබුණද, සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ දිගු කාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් අතර එම අරමුණ සඳහා වන ගෝලීය දර්ශක තුළින් නගර සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍යය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් දැනටමත් සකස් කරමින් පවති. එම අරමුණු වලින් ඇතැම් අරමුණු ඉටු කර ගැනීම සඳහා දැනටමත් වැඩපිළිවෙලවල් පවති. උදා:- ගලි ප්‍රතිකාරක පද්ධතිය හරහා මල අපද්‍රව්‍ය පිරිපහදු කොට පරිසරයට මුදාහැරීම. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 මැයි 21 වෙනි වෙසක්පුර පසලොස්වක පෝය දිනයේදී රට බීම මිලි ලීටර් 163,110 ක් බලපත්‍ර කොන්දේසිවලට පටහැනිව නගර සභාවට අයත් බලංගොඩ තානායමේ අලෙවි කිරීම සඳහා තබා ගැනිම මත රත්නපුර සහකාර සුරාබදු කොමසාරිස් විසින් 2016 අගෝස්තු 08 දින නියම කළ රු. 1,515,000 ක දඩ මුදල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමේ පදනමට සභාව විසින් ගෙවා තිබුණි. දඩ මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා විත්තිකරුවන් තිදෙනෙකුට එරෙහිව අධිකරණයේ පවරන ලද නඩුවේ සහකාර සුරාබදු කොමසාරිස්ගේ චෝදනාපත්‍රයේ සඳහන් වෙසක් මස පුර පසලොස්වක පෝය දිනයේ මත්පැන් විකිණීම යන චෝදනාවද ඇතුළත්ව අනෙකුත් චෝදනා නඩුවේ චෝදනා ලෙස ඇතුළත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | අදාල සියලු චෝදනා නඩුවේ චෝදනා ලෙස ගොනු කර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | බළන්ගොඩ නගර සභා තානායමේ වෙසක් මස පුර පසලොස්වක පෝය දින බලපත්‍ර කොන්දේසි වලට පටහැනිව කරන ලද කාර්‍යයන් නිසා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නියම කරන දඩ මුදල් අයකර ගැනීමට විත්තිකරුවන් තිදෙනකුට එරෙහිව බලන්ගොඩ දිසා අධිකරණයේ මෙම සභාවේ නීතීඥ මහතා මඟින් නඩු පවරා තිබූ අතර විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති චෝදනා කිහිපයක් ඇතුලත් වී නොමැති බැවින් එම චෝදනා නැවත නඩුවට ඇතුලත් කිරීමට නීතීඥ මහතා වෙත ලිඛිතව ඉදිරිපත් කර ඇත. |
| (ආ) | වටිනාකම රු. 596,080 ක් වූ අගරු චෙක්පත් සහ වටිනාකම රු. 4,012,406 ක් වූ ලැබියයුතු වරිපනම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ හා විස්තරාත්මක උපලේඛන පිළියෙල කර නොතිබුණි. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කල යුතු වේ. | අගරු චෙක්පත් සම්බන්ධයෙන් විගණන විමසුමේ සඳහන් විස්තරාත්මක උප ලේඛන ලබාදීමේ හැකියාවක් නොමැත්තේ වසර කීපයක එකතුවක් පවතින බැවිනි. |
| (ඇ) | බස් නැවතුම්පළ සහිත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගෙන තිබුණු ණය වෙනුවෙන් 2005 වර්ෂයේ සිට ගෙවිය යුතු ණය වාරික සහ පොළී එකතුව රු. 145,338,240 ක් ගෙවා නොතිබුණි. . | කාලීනව ගිණුම් නිරවුල් කළ යුතු වේ. | මෙම ණය මුදල පියවීම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලයේදී පැවති සාකච්ජාවේදී සභාව විසින් ණය මුදල පමණක් ගෙවීමටත් හිග පොලිය කපා හැරීමට සහ පොළී ප්‍රතිශතය අඩු කර ණය මුදල ප්‍රතිව්‍යුහගත කර වසර 15 කින් ගෙවීම සඳහා එකඟ විය. ඒ අනුව මහ සභා අනුමැතිය අනුව මසකට රු. 769,680 ක් බැගින් 2019 මැයි මස සිට 2034 අප්‍රේල් මාසය දක්වා වාරික 180 කින් ණය මුදල පියවීමට නියමිතයි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉකුත් වර්ෂවලට අදාලව එකතුව රු. 779,422 ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් 2019 අප්‍රේල් වනවිටත් නිරවුල් කර නොතිබුණි. | කාලීනව ගිණුම් නිරවුල් කළ යුතු වේ. | පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂයන්හි මියගිය සේවකයන්ට අදාලව ශේෂ පවතින්නේද යන්න ප්‍රදේශීය ලේකම් කාර්යාල සමඟ සැසඳීම් සිදු කර ඒ අනුව ගෙවීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2001 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින ලේකම් තනතුර සඳහා 2016 වර්ෂයේ සිට රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිළධාරියෙකු වැඩ බැලීම සඳහා පත්කර තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | විධායක මට්ටමේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ලේකම් තනතුර 2001 ජුලි මස සිට පුරප්පාඩු වුවත් මේ පිළිබද නිරන්තරයෙන් පළාත් පාලන කොමසාරිස් කාර්‍යාලය වෙත දැනුවත් කර ලිපි යවනු ලබන අතර ඉදිරියේදී මෙම පුරප්පාඩුව සම්පූර්ණ වීමට නියමිතය. |
| (ආ) | තනතුරු 10 ක පවතින පුරප්පාඩු 09 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාළ කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටුකිරීමට බාධා වී තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | මෙම සියලු පුරප්පාඩු පිලිබදව කාර්තුමය වශයෙන් අදාල නිලධාරින් දැනුවත් කරනු ලැබේ. |
| (ඇ) | 2016 වර්ෂයේදී කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් බලංගොඩ නගර සභාවේ ගිනි නිවීමේ ඒකකයේ කාර්ය මණ්ඩලයට තනතුරු 20 ක් අනුමත කර තිබුණද එම තනතුරු සඳහා පුද්ගලයන් බඳවා නොගැනීම නිසා එම ඒකකය 2019 අප්‍රේල් වනවිටත් විධිමත්ව ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි. | පුරප්පාඩු පුරවා ගිනි නිවීමේ ඒකකය විධිමත් කිරීමට කටයුතු කල යුතු වේ. | ගිනි නිවීමේ කාර්යය මණ්ඩල තනතුරු සඳහා බඳවා ගැනීම පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සිදුකල යුතු බැවින් මෙම පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුවට දන්වා ඇත. |

**3.4** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විකුණනු ලබන ඉඩමේ වටිනාකමින් සියයට 1 ක බදු මුදල ඉඩම් විකිණීමත් සමඟ විකුණුම්කරු විසින් සභාවට ගෙවන බවට කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹීමෙන් තොරව 2015 හා 2016 වර්ෂ වලදී ඉඩම් වෙන්දේසි 03 | පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විගණන විමසුමේ දක්වෙන ආකාරයට ඉඩම් **03** හි අලෙවි කරන ලද බිම් කට්ටි වලින් 1% ක මුදලක් සභාවට ගෙවන ලෙස අලෙවි නොවී ඉතිරිව පවතින ඉඩම් කට්ටි සඳහා විකුණුම් වටිනාකම මත 1% ක මුදලක් ගෙවීම |

| | | | |
|---|---|---|---|
| | ක විකුණුම් වටිනාකම පිළිබඳ ඇගයීමක් නොකර රු. 15,500 ක් පමණක් අයකරගෙන තිබුණි. | | සඳහා ගිවිසුම් ගත වීමට කටයුතු කරන ලෙස අදාල ඉඩම් හිමියන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | සන අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ ලියාපදිංචිය අළුත් කර ඝණ අපද්‍රව්‍ය මෙහෙයුම් සහායක පාඨමාලාව පැවැත්වීමට ක්‍රමවේදයක් 2017 වර්ෂයේ සිට නොතිබුණු අතර 2017 වර්ෂයේ පුහුණුව අවසන් කළ 73 දෙනෙකු සඳහා අදාළ සහතික පත්‍ර ප්‍රදානය කිරීමට 2019 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි. | පුහුණු මධ්‍යස්ථානයේ ලියාපදිංචිය අලුත් කර පාඨමාලාව යළි ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම පාඨමාලාව පවත්වනු ලැබූ සම්පත් දායක බලන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක 2017 වර්ෂයේදී ස්ථාන මාරු වී යාමත් සමග සන අපද්‍රව්‍ය මෙහෙයුම් පාඨමාලාව පැවැත්වීමට ඇගයුම් කරුවෙකු නොවීය. පුහුණුව අවසන් කර ඇති 73 දෙනාගේ අයදුම්පත්‍ර ලියාපදිංචිය සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත යොමු කර ඇති අතර, පුහුණු මධ්‍යස්ථානයේ ලියාපදිංචිය අළුත් කිරීම සඳහා අයදුම්පත ද යොමු කර ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා වන ව්‍යාපෘති 04 කට රු. 20,000,000 ක ප්‍රතිපාදන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සලසා තිබූ නමුත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ අයවැය ලේඛනය සකස් කිරීමේදී සන අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානය, ප්ලාස්ටික් හා පොලිතීන් මධ්‍යස්ථානයට රු.මි. 15 ක් ද ප්ලාස්ටික් හා පොලිතීන් දාහයක් සඳහා රු.මි. 5 ද ක් ද වශයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මෙම අරමුදල් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් නොලැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා කිසිදු වියදමක් දැරීමට නොහැකි විය. |

## 3.5 වත්කම් කළමනාකරණය

### නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වටිනාකම රු. 24,928,666 ක් වූ මෝටර් ග්‍රේඩරය ක්‍රියාකරුවකු නොමැති වීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට නිෂ්කාර්යව තිබුණි. | වත්කම් ප්‍රයෝජනවත් ආකාරයට උපයෝජනය කල යුතු වේ. | පරිත්‍යාග වශයෙන් ලැබුණු මෙම යන්ත්‍රය සඳහා යන්ත්‍ර ක්‍රියාකරුවෙකු නොමැති බැවින් ප්‍රයෝජනයට ගත නොහැකි වී ඇත. යන්ත්‍ර ක්‍රියාකරුවෙකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනයෙන් රු. මිලියන 31.68 ක් හෙවත් සියයට 70 ක් ඉතිරි වී තිබුණි. | අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර ඇස්තමේන්තු සකස් කළ යුතු අතර එම ඉලක්ක සපුරා ගැනීමටද ක්‍රියා කළ යුතු වේ. | පළාත් සභාවෙන් හා මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යාංශ වලින් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මෙම ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම් දැරීමට නොහැකි විය. මේවා සභාවට පාලනය කල නොහැකි තත්වයන් යටතේ සිදු වන බව කාරුණිකව පෙන්වා දෙමි. |

4.2 නොවිසඳී ඇති නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2008 වර්ෂයට පෙර සිට හඳුනාගත නොහැකිව ඉදිරියට ගෙන එන ලද නොපියවූ අත්තිකාරම් රු. 33,696,533 ක් නිරවුල් කිරීමට 2019 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් නිසි පරිදි හඳුනාගෙන ඒ අනුව නිරවුල් කිරීමට ක්‍රියා කල යුතු වේ. | 2008 ට පෙර සිට පැවත එන අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 33,696,533 ක් තහවුරු කර ගැනීමට ලේඛණ සොයා ගැනීමේ හැකියාවක් නොමැති අතර මෙම අත්තිකාරම් පියවීම සිදු වුවද ගිණුම් ගත වී නොමැති බැවින් දිගින් දිගටම යමින් විශාල ප්‍රමාණයක අත්තිකාරම් ගිණුමේ ශේෂය සෑදී ඇත. මෙම ශේෂය කපා හැරීමට පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. |
| (ආ) | ඉකුත් වර්ෂ වල සිට ඉදිරියට ගෙන එනු ලැබූ රු. 9,303,601 ක් වූ මුදල් මාරු ගිණුමේ ශේෂය 2019 අප්‍රේල් වනවිටත් නිරවුල් කරගෙන නොතිබුණි. | ගණුදෙනු නිවැරදිව හඳුනාගෙන ශේෂ නිරවුල් කිරීමට ක්‍රියා කල යුතු වේ. | 2010 ට පෙර වර්ෂවල මුදල් මාරු කිරීම් නියමිත ලෙස ගිණුම්ගත නොකිරීම නිසා මුදල් මාරු ගිණුමේ රු. 9,303,601 ක මුදලක් දිගින් දිගටම පැවත එන අතර එය ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට තානායම් ගාස්තු හා තානායම් ණයගැතියන් 98 ක ගෙන් වර්ෂ 07 කට වැඩි කාලයක සිට අයකරගත යුතු එකතුව රු. 1,033,459 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් හා ලැබිය යුතු ගිණුම් අයකර ගැනීමට ක්‍රියා කල යුතු වේ. | තානායම ආරම්භ කිරීමේදී තානායමේ සිදුවන අලාභයන් ආවරණය කිරීම සඳහා සේවා ගාස්තු වලින් 20% ක මුදලක් තැන්පත් ගිණුමේ තබා ගැනීමට තීරණය කල අතර එම මුදලින් මේ වන විට තානායමේ අය නොවන ණයගැති ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. |
| (ඇ) | බදු ගිවිසුම් වලට පටහැනිව බස් නැවතුම් පොලෙහි එකතුව රු. 10,100 ක මාසික කුලියකට බදු දෙන ලද කඩකාමර 02 ක් එකතුව රු. 35,000 කට අතුරු බදු දී තිබූ අතර මහජන පොලෙහි කඩකාමර 07 ක් ද, අතුරු බදු දී තිබුණි. ඒ සම්බන්ධයෙන් **2019** මාර්තු වනවිටත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මහජන පොල කඩ කාමර හා බස්නැවතුම්පල කඩ කාමර අතුරු බදු දීම සම්බන්ධයෙන් මේ වන විටත් නගර සභාවේ ආදායම් අංශ නිලධාරීන් විසින් සමීක්ෂණයක් සිදු කර ඇති අතර එම විස්තර පදනම් කර ගනිමින් වාර්තාවක් සකස් කර ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීම පිණිස සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. ඒ අනුව ඉදිරියේදි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |
| (ඉ) | බදු ගිවිසුමට පටහැනිව බදුකරු විසින් මහජන පොළ පිවිසුම ඉදිරිපස කඩ කාමර 02 කට අළුතින් කොටසක් එක්කර විශාලකර තිබුණි. ඊට අමතරව ප්‍රධාන බස්නැවතුම්පලේ කඩකාමර 04 ක එකිනෙකට ගමන් කිරීමට හැකිවන පරිදි ඒවායේ ඇතුළත බිත්ති කඩා සම්බන්ධ කර තිබුණද, සභාව 2019 මාර්තු වනවිටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කඩ කාමර සඳහා අලුතින් කොටස් එකතු කිරීම හා වෙනස් කිරීම සම්බන්ධයෙන් මේ වන විටත් නගර සභාවේ ආදායම් අංශ නිලධාරීන් විසින් සමීක්ෂණයක් සිදු කර ඇති අතර එම විස්තර පදනම් කර ගනිමින් වාර්තාවක් සකස්කර ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති අතර එම උපදෙස්වලට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |